# තරු, හොරු සහ කතුරු



71 කැරැල්ල සමයේ ජනතා විමුක්ති පෙරමුන විසින් රහසිගතව පවත්වා ගෙන පන්ති පහ, එකල බුද්ධිමත් උගත් තරුණ තරුණියන් අතර ජනප්‍රිය වැඩසටහක් විය. ඉතාමත් ආකර්ශනිය වැඩ මුළුවක් වු එයින් එම තරුණ තරුණියන්ට දැනගන්නට අවශ්‍ය වුයේ යථාර්තයයි. අපේ රටට වෙනසක් අවශ්‍ය යැයි සිතු ජනතාව ඒ වටා රහසිගතව හෝ එක්රොක් වුයේ හුදු වාසියක් බලාපොරොත්තුවෙන් නොවේ. ඇත්තෙන්ම එකල ජනතා විමුක්ති පෙරමුණෝ නායකයා වු රෝහණ වීජේවිර දේශපාලන තරුවක් විය. එසේම එකල ජනප්‍රියම සමාජවාදී දේශපාලන පක්ෂය වු සම සමාජයේ කොල්වින් ආර් ද සිල්වා මහතාද දේශපාලන තරුවකි. ඇන් ඇම් පෙරේරා, පිලිප් ගුණවර්ධන වැන්නවුන් ද එකල දේශපාලන අඹරේ පෑයු තරු විය. රැස්වීමකට සවන් දීමට යාමට පෙර පෝස්ටරය බලන්නට පුරුදු වු ජනතාව මොවුන්ගේ කථිකත්වයට ආදරයක් දැක්වුහ. එහෙත් මේ කිසිවෙකුටත් අප රටේ ප්‍රධාන පක්ෂවල ආධාරයෙන් කිසි දිනක බලයට ඒමට නොහැකි වුහ.
දැන් ගී තරු දහස් ගණන් පායන අප රටේ තාරකා වලට අත් වී ඇත්තේද එම ඉරණමය. ප්‍රධාන නාලිකාවේ එස් එම් එස් ව්‍යාපරය මඟින් ඉහළට නඟින මෙම ගී තරු වලට එම නාලිකාවල ආධාරය නොමැතිව කිසි දෙනෙක ඉහළට පා එසවිය නොහැකිය. මෙම තරුවල ප්‍රතිභාව තිරණය කරන්නේ ඔවුන්ය.

සිරස ස්ටාර් , දෙරණ ස්ටාර්, ඩාන්සින් ස්ටාර් , ලිට්ල් ස්ටාර් , ගොවි ස්ටාර්, ශ්‍රි ලන්කන් ලයිෆ් ආදී කී නොකී තාරකා රාශියක් පායා ඇති අහස අඳුරුය. අද රැකියා නැති තරුණියන් රාශියක් ගීයක් ගයා ඉහළට නගින්නට දඟලන්නේ මුදලත් ජනප්‍රියත්වයක් බෙදා හරින දෙවිවරුන් බවට මෙම නාලිකා පත්ව ඇති නිසාය. එහෙත් මෙම ගී තරු පුපුරා අහසෙන් කඩා හැලෙන දිනයක් ගැන තවම අනාවැකි කීමට බැරිය. ඒ ජනප්‍රිය කලාව අද දෙකේ පන්තියේ විප්ලවයක් බවට පත්ව ඇති නිසාය. ජනප්‍රිය කලාව විකුනා කන නාලිකා රාශියක් බිහි වී ඇති නිසාය. එහෙත් මෙයින් ශෝචනීය කාරණය වන්නේ මේ අළුතෙන් පායන සියළුම තරු ගයන්නේ අප රටේ පැරණි ගායක/ගායිකාවන්ගේ ගී වීමයි. ඔවුන් අති දක්ෂය, විශිෂ්ඨය, එහෙත් අනන්‍යතාවයක් නැත. 60, 70 දශකයේ ජනප්‍රිය වු ගී නැවත ගයන ඔවුන් අද එම ගීත ඔවුන්ගේ කරගෙන ඇත.

රු 30000 ක් 40000 ගෙවා සංගීතය යොදා ගෙන තවත් රු ලක්ෂයක් පමණ යොදා ගෙන වීඩියෝ රූප රාමුවක් හදා ගත්තා වු එක් ගායකයෙකු නාලිකා වලට වැඳ වැටෙමින් තම ගීය බොහෝ අමාරුවෙන් ජනප්‍රිය කරවා ගත්තේය. ඔහු එස් එම් එස් තරුවක් නොව ස්ව උත්සාහයෙන් ගායකයෙකු වු තරුවක් වන්නට උත්සාහ නොකරන අවංක ගායකයෙකි. ඔහුට මෙම වියදම් කල මුදලින් ශතයක්වත් ලාභයක් ගන්නට නොහැකි වුයේය. ඔහු නිවී ගිය ගායකයෙක් වු පසු, සුපිරි තරු ගායකයෝ එම ගීය නැවත ගයමින් ලක්ෂ ගණන් මුදල් හම්බ කරති. අතරින් පතර ඔහුගේ නම කියනවා හැරෙන්නට ඔහුගේ නම අද බොහෝ දෙනෙකුට අමතකව ගොසිනි.

දෙරණ සුපර් ස්ටාර් ඕස්ට්‍රේලියාවේදී ඉදිරිපත් කල ප්‍රසංගයේදී සියලු නවක තරු ගැයු ගී වල හිමිකම් කාගේදැයි ප්‍රේක්ෂකයෝ නොදනිති. 60 දශකයේ කේ. සේන නැමැති ගායකයා සරල ගී වැඩ සටහනකට ගායනා කර ජනප්‍රිය වු "මවකගේ උණුසුම නොලබා සැපට නිදන පුතේ" ගීය කාගේදැයි කිසිවෙක් දන්නේ නැත. මගේ මිතුරෙකු කීවේ එය චිත්‍රපට ගීයක් කියාය. ප්‍රදීපා ධර්මදාස ගැයු "නාඩන් පුංචි හිරමණේ" ගීයේ අයිතිකරුවා වන්නේ රත්න ශ්‍රී විජේසිංහයි. ඔහු අද රැකියාවක් වත් නැතිව ගෙදරට වී කාලය ගත කරයි. අමරසිරි පීරිස් ගායනා කරන "ලඳුනේ" ගීය රචනා කලේ රන්බණ්ඩා සෙනෙවිරත්නයි. ඔහු අද ජීවතුන් අතර නැත. ඔහු ගැන මතක් කරන්නට කෙනෙකු ද නැත. දෙරණ වැඩසටහන් නිෂ්පාදකවරු ඕස්ට්‍රේලියානු ප්‍රසංගවලදී ඒ වෙනුවෙන් විනාඩි 10 ක 15 කාලයක් වත් වෙන් කලානම් කොතරම් වටිනේද?

වරක් සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රියා සුරියසේන කියා සිටියේ ඔහු ගායනා කල ගී අද ඔහුටත් ගායනා කිරිමට අවස්ථාවක් නැති බවය. ඒ ප්‍රසිද්ධ සංගීත සංදර්ශන වලදී ඔහුගේ ජනප්‍රියම ගීත පහක් ඔහුට ගායනා නොකරන ලෙසත් සුපර් ස්ටාර් කෙනෙකු එම ගී ගායනා කරන නිසා වෙනත් ගී කිහිපයක් තෝරා ගන්නා ලෙස සංවිධායකවරු අණ කිරිම නිසාය. " එහෙනම් මගේ සියළුම ගීත ඔහු ලවාම ගායනා කර ගන්නා ලෙස " කියා ඇති ප්‍රියා සුරියසේන සංගීත සංදර්ශනයේ වේදිකාවෙන් බැස ගෙදර ඇවිත් ඇත. වරක් ලතා වල්පොල කියා සිටියේ මෑතකදී සුපර් ස්ටාර් වලින් තේරී පත් වු එක් ගායිකාවක් ඇයගේම ගීත ගායනා කිරිමට ඇය මෙන් දෙගුණයක් මුදල් අය කරගන්නා බවය.

"රඟහල දැන් ඇත අඬ අඳුරේ " ගීය හැත්තෑව දශකයේ ජනප්‍රිය ගීයක් වු බව එම ගීය රසවිඳි අපි කවුරුත් දනිමු. එහෙත් අනුව දශකයේ එම ගීය නැවත ජනප්‍රිය කරවුයේ සංගීත් විජේසුරියයි. සංගීත් එයට රැප් සංගීතය යොදමින් නොයෙක් අලංකාර එකතු කොට නැවත ජනප්‍රිය ගීයක් බවට එය පත් කළ අතර වේදිකාවේදී ඔහුගේ ප්‍රධානතම ගීය වුයේත් එම ගිතයයි. විජේරත්න වාරකාගොඩට වඩා දක්ෂ ගායකයෙක් තමාට ඇති බව එම ගීයෙන් ඔහු ප්‍රේක්ෂකයාට පෙන්වන්නට , උත්සාහ කල අතර එය සාමාන්‍ය දුරට සත්‍යයක් වුවත් එහි මුල් ගායකයා අසරණව නිහඬව බලා සිටියේය. එහි ගීත රචක හඩිසන් සරමසිංහ නොවන්නට අදත් එම ගීයේ අයිතිකරු වන්නේ සංගීත්ය. තමන්ගේම අනන්‍යතාවක් ගොඩා නගාගෙන තිබියදී අනුන්ගේ ගීයකින් වේදිකාවට ගොඩවු සංගීත්ට අන්තිමේදී සිදු වුයේ ගීයේ අයිතිකරුට රු ලක්ෂ දහයක වන්දියක් ගෙවීමටය.

වත්මනේ දෙරණ ලිට්ස් ස්ටාර් තරඟවලදී ගී ගායනා කරන දරුවන් ගායනා කරන්නේ වැඩිහිටි ගීතයි. ළමා ගීත සාහිත්‍යයක් ඇති ළමා මනසට ගෝචර වන ගී වෙනුවට විරහව, ආදරය තෝරා ගන්නා ළමා පරපුරක් අද ජනතාව අතර ජනප්‍රිය වන්නේ මිල්ටන් ජෝති ඇම් එස් අමරදේව ආදීන් ලෙසය. අපේ අනාගත ගීත කලාව පෝෂණය වන්නේ ඔවුන් අතිනි. අද කුඩා ළමුන් ගායනා කරන්නේ අදුර අඳුර මගේ, හාදු වැස්සක් අරන්, මගේ ලමැද සුව යහනක්, ලමැද තලා යහනේ ඉන්නම් ආදී ජනප්‍රිය තලයේ භෘංගාරය පිරී ඉතිරී යන ගීතයි. දෙරණ ලිට්ස් ස්ටාර් තරඟවලදී වැඩියෙන්ම ජනප්‍රිය වු ළමා ගායකයා වුයේ සීසන් ටු තරඟවලියෙන් තේරී පත් වු හිමාෂ නැමැති වයස අවුරුදු හතේ පමණ වු කුඩා දරුවායි. ඔහු ජනප්‍රිය ළමා ගායකයෙක් වුයේ වැඩිහිටි ගීත ගායනා කළ නිසාය. එම ගී අසන ප්‍රේක්ෂකයා රසයට වඩා විඳින්නේ විනෝදයයි.

වැඩිහිටි, එසේම අදහස් වලින් බරැති සිංහල වචන ළමා හඬකින් පිටවන විට එහි ලාලිත්‍ය විනෝදයට බරය. එසේම ඔහුගේ වැඩිහිටි දෙමව්පියන් එම දරුවාට ගී පුරුදු පුහුණු කර ඇත්තේද වැඩිහිටි ප්‍රේක්ෂක මනස ඩැහැගන්නා ලෙසය. ඔහු කුඩා දරුවන් එතරම් ආදරය නොකරන එහෙත් වැඩිහිටියන් ආදරය කරන වැඩිහිටි ළමා ගායකයෙක් කිවහොත් එය නිවැරදිය. බොහෝ සුළු කලකින් ජනප්‍රිය තරු අතරින් ඔහුද විසි වී යන්නේ කිසිම පැවැත්මක් නැතිවය. ඊළඟට පැමිණෙන ලිට්ල් ස්ටාර්ට දෙර විවර කර දෙන නාලිකා වලට "ලිට්ල්ලා" වෙනුවෙන් මීට වඩා යමක් කරන්නට අවකාශ තිබියදී, ඔවුන් කරන මෙම වැඩසටහන් වලින් අනාගතයට කිසිදු සෙතක් සිදු වන්නේ නැත.

මාවතක් විදීයක් නැති තරු දහස් ගණනන් බිහිවන සිරිලක් බිම අද එකම ගී සැණකෙලියකි. තමන්ගේම ගී නිර්මාණය කරමින් ඉදිරියට ඒමට කිහිප දෙනෙකු උත්සාහ කලත් එයින් ප්‍රේක්ෂක ජනතාව අතරට යාමට ඔවුන්ට තාමත් නොහැකි වී ඇත. ඒ අතරින් ප්‍රේක්ෂකයන් අතරට ජනප්‍රියම ගායකයා වුයේ චාමික සිරිමාන්නයි. එහෙත් ඔහු මුලින්ම කැපී ගිය හැලී ගිය තරුවකි. මුලින්ම බිමට වැටුනු තරුවක් ජනප්‍රියට වු පළමු අවස්ථාව එය විය. අද රු ලක්ෂ 15-20 ක් නොමැතිව සී ඩී ඇල්මයක් වෙළෙඳ පොලට ඉදිරිපත් කිරිමට නොහැකිය. මුදල් අතේ ඇති පිරිසට යන්තම් ගායන හැකියාවක් තිබුණත් ගායකයෙක් වීමට පරිසරයක් නිර්මාණය වී ඇත්තේ ඒ නිසාය. එහෙත් ස්ටාර් වලින් තේරී පත්වන දක්ෂ දරුවෝ ඉතාමත් දක්ෂ ගායකයෝය. දෙරණ ස්ටාර් තුළින් බිහි වු උපේකා මෑත කාලයේ ස්ටාර් තරඟා වලින් බිහිවු දක්ෂ ගායිකාවකි. ඇයට ඇති ගායන පරාසය අති පුළුල්ය. ටී ටම් ජයරත්න අයිවෝ ඩෙනිස්, සුනිලා අබේසේකර, වැනි දක්ෂයන් එකට එකතු වී ගායනා කළ ඩබ්ලිව් ජයසිරි ලියු ප්‍රේමසිරි කේමදාස සංගීතවත් කල බඹරු ඇවිත් චිත්‍රපටියේ හදුනා ගත්තොත් ඔබ මා ගීය ඇය කිසිදු අපහසුතාවකින් තොරව තනිවම ගායනා කරයි. කොරතම් දක්ෂතා වලින් පිරිපුන් වුවත් මොවුන්ගේ පැවැත්ම කෙටි කලකට සීමා වන්නේ ඇයිද යන්න සොයා බැලීමට කාලය එළඹ ඇති මේ වකවානුවේ, ඔවුන් වැනි දක්ෂයන් ඉදිරියට ගෙනයාමට අප රටේ ප්‍රවීනයන්ට යම්කිසි කාර්ය භාරගයක් ඉටු කිරිමට හැකිනම් කොතරම් අගනේද ? කලාව වෙළඳපොළක්ම නොතිබු අවදියක තරු බිහි නොවු ඉරක් සඳක් මෙන් විශ්වාසවන්ත බැබලෙන කලාකරුවන් ගොන්නක් බිහි වු මව්බිමේ තාරුකා බවට පත්ව ඇත්තේ රූපවාහිනී නාලිකා ගොන්නකි. කලාකරුවාගේ වටිනාකම තිරණය කරන්නේ ඔවුන්ය. අද වික්ටර් , නීලා, නන්ද මාලිනීලාගේ ගී ප්‍රචාරය කිරිමට මුදල් ඉල්ලති. මුදල සහ කලාව අතර වෙනස වටහා ගන්නා තුරු




කලාව වෙළඳපොලට තුල විකිණෙයි. එහෙයින් කලාවේ පැවැත්මට යමක් කළ හැකි දක්ෂයන් එකතු වී ඒ වෙනුවෙන් තිර යමක් කිරිමට අවශ්‍ය කාලයයි මේ. එතෙක් දක්ෂයන් තරු වී බිමට වැටෙන්නේ එල්ලෙන්නට තරුවක්වත් නැතිවය. සිංහල භාෂාවත් එකී භාෂාවෙන් නිර්මාණය වන ගේය පද රචනාවත් ඇති ශක්තිමත් බැම්ම සාර්ථක ගීයකට අතිශයින්ම බලපායි. ඒ නිසා ගේය පද රචකයන්, සංගීතඥයන් ගායකයන් එකට එක්වී නාලිකා වලට නොව කලාවට හරවත් යමක් කල යුතුයි.

LANKAN
AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886
9798 2200
14/30 Tower Court
Noble Park 3174